# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 7.

**Tel: 11 4062180-190, 011 2565304, Fax: 011 4714460, 0114503001**.

**E-mail:** cmev@cpalanka.org **Website:** www.cmev.org

**ජනාධිපතිවරණය 2015,**

**තැපැල් ඡන්ද විමසීම - මාධ්‍ය නිවේදන 03**

**2014-12-24 වන දින කොළඹ - ශ්‍රී ලංකාව.** වාර්තා වූ සිද්ධීන් කිහිපයක් සමග දෙවන දිනටත් තැපැල් ඡන්දය අද දවසේ පැවැත්විණි. අද දවස වන විට බරපතළ සිද්ධීන් 23ක් සහ සුළු සිද්ධීන් 34ක් ඇතුලුව සමස්ත සිද්ධීන් 57ක් තැපැල් ඡන්දයට අදාළ ව වාර්තා වී ඇත. පහර දීම් තර්ජනය හා බලපෑම් කිරීම් , මැතිවරණ නිලධාරීන් සිදු කරන වැරදි සහ බලහත්කාරයෙන් ඡන්ද මධ්‍යස්ථාන අසළ රැඳී සිටීම බරපතළ සිද්ධීන් ගණයට ඇතුළත් වේ. මැතිවරණ වැරදිවලට අදාළ ව අනෙකුත් සියලු සිද්ධීන් සුලු සිද්ධීන් ලෙස වර්ගීකරණය කර ඇත.

එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන කාර්යාලය වන සිරිකොත අසළ ඇති වූ ගැටුමත් සමග අද දවස ආරම්භ විය. එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා සහ පොදු අපේක්ෂක මෛත්‍රිපාල සිරිසේන මහතා අතර ඇති කර ගෙන තිබේ යැයි චෝදිත රහසිගත ගිවිසුමේ තොරතුරු ඉල්ලා සිටිමින් උදෑසන 10.45ට පමණ සිරිකොත ඉදිරිපිට දී පුද්ගලයින් 1000කගෙකත් පමණ සමන්විත කණ්ඩායමක් විරෝධතාවයේ නිරත වූ බවට මැ.ප්‍ර.නි.ම.ට දැනගන්නට ලැබුණි. විරෝධතාව පැවැත්වෙන අවස්ථාවේ 1500කගෙන් පමණ සැදුම්ලත් පිරිසක් සිරිකොතෙහි පැවති ගුරුවරුන්ගේ වැඩමුළුවකට සහභාගී වෙමින් සිට ඇත.

සිරිකොත මැතිවරණ මෙහෙයුම් කාමරයේ ප්‍රධානී රජීව් සෙනෙවිරත්න මහතාගේ සහයක අයිවන් සිල්වා මහතා මැ.ප්‍ර.නි.ම.ට දන්වා සිටියේ ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මහතාගේ සහයෝගය යටතේ එකී පෙරමුණ විසින් විරෝධතාව සංවිධානය කර තිබූ බවයි. අයිවන් සිල්වා මහතාට අනුව ජාතික නිදහස් පෙරමුණට සම්බන්ධ ජීවන්ත ජයතිස්ස, මහින්ද සමරතුංග, ඩී.එම්.සෙනෙවිරත්න, අනුර අතපත්තු, වසන්ත බණ්ඩාර සහ එක්සත් ජනතා නිදහස් සන්ධාන ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ප්‍රියංකා කොතලාවලගේ ස්වාමිපුරුෂයා යන අය විරෝධතාවයේ යෙදී සිට ඇති බවට සැක කරයි. සිද්ධිය ඇසින් දුටුවෙකු ප්‍රකාශ කර සිටියේ ඉහත සඳහන් කළ පුද්ගලයින් GI-8272 දරණ වාහනයෙන් සිද්ධිය සිදු වූ ස්ථානයට පැමිණි බවයි.

විමල් වීරවංශ ඇමැතිවරයාගේ මාධ්‍ය ලේකම් ප්‍රසාද් මංජු මැ.ප්‍ර.නි.ම.ට දන්වා සිටියේ විරෝධතාවය ජාතික සංවිධාන එකමුතුව නියෝජනය කරමින් වෛද්‍ය වසන්ත බණ්ඩාර විසින් සංවිධානය කළ බවයි. පිරිස පාලනය කිරීම සහ ජන රාශිය විසිරුවා හැරීම සඳහා මිරිහාන පොලීසියේ නිළධාරීන් සහ කැරළි මර්ධන ඒකකයේ නිලධාරීන් ගෙන්වන ලදි. කණ්ඩායම් දෙක අතර ඇති වූ ගැටුම හේතුවෙන් සිරිකොත ඉදිරිපස පිහිටි බුදු පිළිමය ඇතුළු දේපළවලට හානි සිදු විය. බණ්ඩාර මහත්මාට අනුව පුද්ගලයන් හත් දෙනෙකු හෝ අට දෙනෙකු කොළඹ දකුණ ශික්ෂණ රෝහලට රැගෙන යන ලදි.

තැපැල් ඡන්දයේ දෙවන දිනය වූ අද දිනයේ තවත් සිද්ධීන් කිහිපයක් වාර්තා විය.

**මුලතිව් දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මුලතිව් රෙජිමේන්තුව-විශ්වමඩු**

මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක වාර්තා කරන ලද්දේ ඡන්දය භාවිතා කරන ආකාරය පිළිබඳව ජනතාව දැනුවත්ව නොසිටි බැවින් සහකාර තේරීම්භාර නිලධාරී ඒ.සුන්දර මූර්ති මහතාට ඔවුන් වෙනුවෙන් ඡන්දය භාවිතා කිරීමට සිය ඡන්ද පත්‍රිකා ලබා දුන් බවයි. ඒ ආකාරයෙන් සහකාර තේරීම්භාර නිලධාරියා විසින් ඡන්ද 03ක් සළකුණු කරන ආකාරය මැ.ප්‍ර.නි.ම. නියෝජිත නිරීක්ෂණය කර ඇත. සහතික කිරීමේ නිලධාරී ලුතිනන් කර්නල් ජේ .පී. ගණේගොඩ මෙම අවස්ථාවේ ඡන්ද මධ්‍යස්ථානය භාරව සිටින ලදී. ඡන්ද මධ්‍යස්ථානයේ නම් ලැයිස්තුවේ නම් 931න් 477දෙනෙකු ඒ වන විටත් ඡන්දය භාවිත කළ බව මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක වාර්තා කරන ලදී.

**මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩුරිප්පුහි ශ්‍රී ලංකා යුධ හමුදා කඳවුර**

ඡන්දදායක ලැයිස්තුවේ තිබූ විෂමතාවක් මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක වාර්තා කරන ලදී. ඡන්ද මධ්‍යස්ථානයට අදාළ ලැයිස්තුවේ ඡන්දය දැමීම සඳහා පුද්ගලයින් 254ක් ලියාපදිංචිව සිටි අතර එහි සහතික කිරීමේ නිලධාරී දෙවන අණදෙන නිලධාරී පී.ඩී.එල්.ඩී. අල්විස් මහතා ලඟ තිබූ ලැයිස්තුවේ නම් 367ක් විය.

**පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව**

23වන දින ප.ව.9.30ට පමණ එක්සත් ජාතික පක්ෂයේ ආඬිගම සහ පාළමසේරුකැලේ ප්‍රදේශවල පිහිටි අලුතෙන් ආරම්භ කළ ප්‍රචාරක කාර්යාල දෙකකට පහර දීමක් මැ.ප්‍ර.නි.ම.ට වාර්තා විය. කාර්යාලය සහ එහි තිබූ ගෘහ භාණ්ඩ මෙන්ම ඡන්ද ව්‍යාපාරයට අදාළ උපකරණ විනාශ කර තිබෙනු මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක නිරීක්ෂණය කර ඇත . පාර්ලිමේන්තු මන්ත්‍රී පාලිත රංගේ බණ්ඩාර මහතා මැ.ප්‍ර.නි.ම.ට දන්වා සිටියේ පෙර දින උද්‍ඝාටනය කළ කාර්යාලයට එක්සත් ජනතා නිදහස් සංධාන වයඹ පළාත් සභා මන්ත්‍රී සනත් නිශාන්තගේ ආධාරකරුවන් පිරිසක් පහර දුන් බවයි.

**කොළඹ දිස්ත්‍රික්කයේ උමගිලිය ක්‍රීඩාංගණය**

පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ රැස්වීමක් පැවැත්වීමට සකස් කරමින් තිබූ වේදිකාවට සහ රැස්වීම් ප්‍රදේශයට 24 දින පැය 00:40ට පමණ පුද්ගලයින් පිරිසක් විසින් පහර දී ඇත. 24වන දින පැවැත්වීමට නියමිතව තිබූ රැස්වීම සඳහා පුදගලයින් 8ත් 10ත් අතර පිරිසක් වේදිකාව සහ රැස්වීම් භූමිය සකස් කරමින් සිට ඇති බව මැ.ප්‍ර.නි.ම.ට දැනගන්නට ලැබුණි. ඒ වන විට තවත් පිරිසක් ක්‍රීඩා පිටියේ සහ මාර්ගයේ ද සිට ඇත. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පෝස්ටර් සහිත ජීප් රථ දෙකක් සහ වෑන් රථයක් පැමිණ වැල්ලම්පිටිය පොලීසියට අයත් ජීප් රථය අසළ නවතා ඇත. ආයුධ සන්නද්ධ එක් පුද්ගලයෙක් එක් වාහනයකින් බැස වෙඩි වාර 17ක් පමණ වේදිකාවට සහ එහි වහලය දෙසට එල්ල කර ඇත. එහි සිටි වැල්ලම්පිටිය පොලීසියේ උප පොලිස් පරීක්ෂක තෙන්නකෝන් සහ තවත් නිලධාරීන් නව දෙනෙකු ද වේදිකාව සකස් කරමින් සිටි පිරිස ද ආවරණයක් සොයා ගැනීමට දිව ගොස් ඇත. එම ස්ථානයේ සිටි වයි එෆ් එම් සේවයේ කළමණාකාර සජිත් නන්දන රත්නායක මහතා විස්තර කළේ එක් වාහනයක් අංක JG-7783 දරණ සුදු පැහැති වෑන් රථයක් වූ බව සහ අනෙක් ජීප් රථ දෙක රතු අංක තහඩු සහිත වීදුරු අඳුරු කළ වාහන බවයි. සිදුවීමෙන් පසු වාහන දෙමටගොඩ දෙසට පලා යනු ඔහු දැක ඇත. කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාපති ප්‍රසන්න සෝලංගාරච්චි මැ.ප්‍ර.නි.ම.ට ප්‍රකාශ කළේ එම ස්ථානයේ සිටි පොලිස් නිලධාරීන් මෙම සිදුවීම නැවැත්වීමට කිසිවක් නොකළ බවයි. වැල්ලම්පිටිය පොලිස් ස්ථානයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක අමරබන්ධු මහතා විසින් වැඩිදුර පරීක්ෂණ සිදු කරන බව මැ.ප්‍ර.නි.ම.ට ප්‍රකාශ කරන ලදී.

මැ.ප්‍ර.නි.ම. වර්ෂ 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සංධානය එක්ව ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයක් ලෙස මැතිවරණයන්හි ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණයට ස්ථාපිත කරන ලදී. වර්තමානය වන විට මැ.ප්‍ර.නි.ම. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් සහ මානව හිමිකම් දත්ත කේන්ද්‍රයෙන් (INFORM) සමන්විත වේ.

මැ.ප්‍ර.නි.ම. සියලු වාර්තා සහ මාධ්‍ය නිවේදන www.cmev.org වෙතින් ලබා ගත හැකිය.

ආචාර්ය පී. සරවනමුත්තු

සම කැඳවුම්කරු